# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,703 — 1966 ජූලි 8 වැනි සිකුරාදා — 1966.7.8

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන .. .. .. | 493 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන .. .. .. | 504 |
| ඝනතුරු-ඇබෑර්තු .. .. .. .. | 495 | අය-වැය ලේඛන .. .. .. | 506 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය .. .. .. | 499 | දේපළ විකිණීම .. .. .. | — |
| අතුරු ව්‍යවස්ථා .. .. .. | 502 | මාර්ග කොමිටි දන්වීම .. .. .. | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දන්වීම .. | 504 | විවිධ දන්වීම .. .. .. | 508 |


## පළාත් පාලන නිවේදන

### ගම්සභා ආඥාපනත

#### 13 වන වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරන ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරිය) ගම්සභා ආඥාපනතෙහි 13 (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, (ඉහළ) මධ්‍යම දිසාවේ සහකාර පළාත් පාලන කොමසාරිස්, ඩී. අලුවිහාරේ වන මම, මාතලේ දිස්ත්‍රික්කයේ ඉනාමලුව කෝරලේ ගම්සභාවේ අංක 14 දරන කොට්ඨාශයේ සභික ඒ. රන්බන්ඩා මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් තුනකට වැඩි ගණනකට, තමන් තෝරා පත්කරගනු ලැබීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමට පත්ව, මාතලේ දිස්ත්‍රික්කයේ ඉනාමලුව කෝරලේ ගම් සභාවේ අංක 14 දරණ කොට්ඨාශයේ සභික ඒ. රන්බන්ඩා මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළකිරීමේ දින සිට තම සාමාජිකත්වය අත්හරිනලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ඩී. අලුවිහාරේ,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
(ඉහළ) මධ්‍යම දිශාව.

1966 ජූනි මස 26 දින,
මාතලේ දී ය.

7-699—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 පෙබරවාරි මස 11 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

## ගම්සභා ආඥාපනත

### 13 වන වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා සංශෝධිත පනතින් සංශෝධිත (257 වැනි අධිකාරිය) ගම්සභා ආඥාපනතෙහි 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණ බලතල ප්‍රකාර පහළ දකුණු මාතර කොටසේ සහකාර පළාත් පාලන කොමසාරිස් හෙට්ටි ආරච්චිගේ පියදාස අභයවර්ධන වන මම මාතර දිස්ත්‍රික්කයේ කනංගේ ගම්සභාවේ අංක 9 දරණ කොටසේ සභික කැන්දවල ආරච්චිගේ සමරපාල මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභා රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් තෝරා පත්කිරීමෙන් පසු, නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව මාතර දිස්ත්‍රික්කයේ කනංකේ ගම්සභාවේ අංක 9 දරණ කොටසේ සභික කැන්දවල ආරච්චිගේ සමරපාල මහතා මේ දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දිනයේ සිට නම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

එච්. ඒ. පී. අභයවර්ධන,
පළාත් පාලන සහකාර කොමසාරිස්තැන,
පහළ දකුණු දිසාව, මාතර.

1966 ජූනි මස 30 වන දින,
මාතර පළාත් පාලන කාර්යාලයේදීය.

7–702—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 17 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17(I) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නැගෙනහිර (පහළ) කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්, බර්ට්‍රම් අර්නෝල්ඩ් ජයරාජා කාසිනාදර් වන ම විසින්, මෙයට යා කොට ඇති උපලේඛනයේ පළමුවැනි තීරුවෙහි දක්වෙන එක් එක් ගම්සභාවේ ප්‍රථම රැස්වීම, එකී උපලේඛනයේ දෙවෙනි තීරුවෙහි අනුරූපිතව දක්වෙන නියමිත දිනයෙහිදී ද, එකී උප ලේඛනයේ තෙවැනි තීරුවෙහි අනුරූපිතව දක්වෙන නියමිත වේලාවටද, එකී උපලේඛනයේ සිවුවැනි තීරුවෙහි අනුරූපිතව දක්වෙන නියමිත ස්ථානයේදී ද, මෙයින් කැඳවා සිටිනු ලැබේ.

බී. ඒ. ජේ. කාසිනාදර්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
නැගෙනහිර (පහළ) කොට්ඨාශය.

1966 ජූලි මස 3 දින,
මඩකලපුවේ
පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| පළමු වැනි තීරුව ගම්සභාවේ නම | දෙවෙනි තීරුව දිනය | තෙවෙනි තීරුව වේලාව | සිවුවෙනි තීරුව ස්ථානය |
|---|---|---|---|
| මන්ඩූර් | ... 66. 7.15... | පූ.භා. 9.30... | මන්ඩූර් ගම්සභා කාර්‍යාලයේදී |
| නවගිරි නගර් | ... 66. 7.15... | පූ.භා. 11.30... | නවගිරිනගර් ගම්සභා කාර්‍යාලයේදී |
| පලුගාමම් | ... 66. 7.15... | අ.භා. 2.30... | පලුගාමම් ගම්සභා කාර්‍යාලයේදී |
| කල්ලාර් තුරයිනිලා වනයි | 66. 7.18... | අ.භා. 3.00... | කල්ලාර් තුරයිනිලා-වනයි ගම්සභා කාර්‍යාලයේදී |
| කරවහු බටහිර | ... 66. 7.19... | අ.භා. 2.00... | කරවහු බටහිර ගම්-සභා කාර්‍යාලයේදී |
| කරවහු උතුර | ... 66. 7.19... | අ.භා. 3.30... | කරවහු උතුර ගම්සභ කාර්‍යාලයේදී |
| සමන්තුර බටහිර | ... 66. 7.20... | පූ.භා. 10.00... | සමන්තුර බටහිර ගම්-සභා කාර්‍යාලයේදී |
| උඩ පළාත | ... 66. 7.22... | පූ.භා. 10.00... | උඩපළාත ගම්සභා කාර්‍යාලයේදී |
| මැද පළාත | ... 66. 7.22... | පූ.භා. 11.30... | මැද පළාත ගම්සභා කාර්‍යාලයේදී |
| එරාවූර් දකුණ | ... 66. 7.23... | පූ.භා. 9.30... | එරාවූර් දකුණ ගම්සභා කාර්‍යාලයේදී |
| ඒරාවූර් බටහිර | ... 66. 7.23... | පූ.භා. 11.15... | ඒරාවූර් බටහිර ගම්-සභා කාර්‍යාලයේදී |

7–698—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 17 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය වන) 17 (1) දරන වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර දකුණු කොට්ඨාශයේ (ඉහළ) පළාත් පාලන සහකාර කොමසාරිස් වික්‍රමරත්න කොඩිප්පිල ආරච්චි පටබැඳිගේ පර්සි අබේසිංහ වන ම විසින් 1966 ජූලි 18 වැනි දින උදේ 10.30 ට අකුරල පිහිටි මාදම්පේ ගම්සභා කාර්යාලයේ දී ගාළු දිස්ත්‍රික්කයේ මාදම්පෙ ගම්සභාවේ ප්‍රථම රැස්වීම මෙයින් කැඳවා සිටිනු ලැබේ.

වික්‍රමරත්න කොඩිප්පිල ආරච්චි පටබැඳිගේ පර්සි අබේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
(දකුණු කොටස ඉහළ).

1966 ජූලි 3 වැනි දින,
ගාල්ල පළාත් පාලන කාර්යාලයය.

7–669—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### ගම්සභා ආඥාපනතේ 17(I) වගන්තිය යටතේ වූ දැන්වීම යි

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17(I) දරණ වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර, වයඹ කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්, කාරිය වසම් පතිරගේ එඩ්වින් පියතිලක වන මා විසින්, මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් ගම්සභාවේ සභාපති පත්කර ගැනීම සඳහා 2 වැනි තීරුවේ සඳහන් දිනයෙහිදී 3 වැනි තීරුවේ සඳහන් වේලාවේදී 4 වැනි තීරුවේ සඳහන් ස්ථානයේ දී ප්‍රථම රැස්වීම මෙයින් කැඳවනු ලැබේ.

කේ. පී. ඊ. පියතිලක,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
වයඹ කොට්ඨාශය.

1966 ජූනි මස 29 වැනි දින,
කුරුණෑගල සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ දීය.

### උපලේඛනය

| 1 වැනි තීරුව ගම්සභාවේ නම | 2 වැනි තීරුව දිනය | 3 වැනි තීරුව වේලාව | 4 වැනි තීරුව ස්ථානය |
|---|---|---|---|
| යගම් පත්තු | ... 1966. 7.14 ... | ප.ව. 2.30 | ... යගම් පත්තු ගම්සභා කාර්යාලය |

7–555—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 17 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

1961 අංක 60 දරණ පණතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17(1) දරණ වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර ඌව කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් මුතුබණ්ඩා සමරකෝන් වන මා විසින් මීට යාකොට ඇති උපලේඛනයේ I වැනි තීරුවෙන් නියමිත එක් එක් ගම්සභාවේ ප්‍රථම රැස්වීම එකී උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනින් නියමිත දිනයේදී එකී උපලේඛනයේ III වැනි තීරුවේ අනුරූප සටහනින් නියමිත වේලාවට, එකී උපලේඛනයේ IV වැනි තීරුවෙන් නියමිත ස්ථානයේදී මෙයින් කැඳවනු සිටිනු ලැබේ.

මුතුබණ්ඩා සමරකෝන්,
ඌව කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

1966,7.1 දින,
බදුල්ලේදීය.

### උපලේඛනය

| I වැනි තීරුව ගම්සභාවේ නම | II තීරුව දිනය | III වැනි තීරුව වේලාව | IY තීරුව ස්ථානය |
|---|---|---|---|
| බින්තැන්න උතුර ගම්සභාව | 1966. 7.20... | පෙ.ව. 11... | මහඔය පිහිටි ගම්සභා කාර්යාලය |

7–690—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන (පාලන කොට්ඨාශ) පිළිබඳ ආඥාපනත

(265 වැනි අධිකාරය)

ත්‍රිකුණාමලයේ, නැගෙනහිර (ඉහළ) කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් එන්. සිවරාජා මහතා 1965 ජූනි මස 1 වැනි දින සිට 1965 ජූනි මස 30 වැනි දින දක්වා සිය රාජකාරිවලට අමතරව, වවුනියාවේ, උතුර (පහළ) කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට පත්කර තිබෙන බැව් දැනුම් දෙමි.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
පළාත් පාලන කොමසාරිස්.

1966 ජූනි මස 30 වැනි දින,
කොළඹ දී ය.

7–693—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

---

# තනතුරු — ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**1. දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශෙෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥාපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරනලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලන ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේ දී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශිය බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඇ) ස්ත්‍රීන් ද, වයස 55ට වැඩි නිලධාරීන් ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින්දා ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දැරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4 ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරු වලට පත් වන්නන්ට නියම කල හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

**4. නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදාල පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැත්නම් අවුරුදු 3ක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝග වලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස "නව ප්‍රවේශක නිලධාරීන්ටත්" නියම කරනු ලැබෙයි.

(iii) (අ) ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුලත දී සිංහල භාෂාව විෂයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම අනිකුත් කරුණු අතර, නියමිත කාල සීමාවන් තුළදී සිංහලය පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමාවන් තුළදී මේ ප්‍රවීණතා පරීක්ෂණයන් ගෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමිය හැකිවන අතර, නියමිත කාල සීමා වෙන් පසු වැඩිපුර කාලසීමාවක් ඇතුලතදී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමීම, වැටුප් වැඩිවීම නතර කිරීමක් බවට පරිවර්තනය කරනු ලැබේ. එසේ නතර කිරීම පරීක්ෂණයෙන් සමත් වනතුරු බලපවත්වනු ඇත. (අංක 13,387 සහ 62.11.9 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍යභාෂා පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලන්න.)

(ඇ) **අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අඩුම සුදුසුකම් වශයෙන් නියම කොට ඇත්තාවූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුවකුට ජ්‍යෙෂ්ඨ පඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගය කින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සාමර්ථ්‍යයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදාල නොවේ.)

(ඈ) **කාර්යක්ෂමතා කඩඉම්.**—පත්වීම ස්ථිර කරන ලද දිනයේ සිට අවුරුදු 2 ක් ඇතුලතදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් වන ලෙස නව ප්‍රවේශක නිලධාරීන්ට නියම කරනු ලැබිය හැකිය. මේ පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම කල් දැමීමය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

(v) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වුවහොත් අංක 21 සහ 22 දරණ පළාත් පාලන සේවා රෙගුලාසිවල සාමාන්‍ය විධිවිධාන බලපවත්වනු ඇත.

(ඉහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

සටහන.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරී" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත් කර ගනු ලබන නිලධාරීන් ය.

5. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින් ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. සේවා මුක්ත හටසින් සඳහා අනුග්‍රහ.—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවලට නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම, අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සභාපති මඟින් හෝ නාගරික කොමසාරිස්වරයා මඟින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයෙක් විසින් ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුම හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාහැරීමට තමන් සූදානම්ව සිටින්ද නැත්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් කැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ මුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පසු කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘතිපත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපෑලේ දී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා කැමැත්තෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි සහ ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ සවකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙනම වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

——————තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය : ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් හැඳුනුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ විගසම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| | පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| | විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයන් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස්වූ දිනයන් දක්වමින් දැරූ තනතුරු සඳහන් කරන්න):————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සවිස්තර (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :

(i) තනතුරේ පදවි නාමය. ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත හටයෙක් නම්—

සේනාංකය තරාතිරම, සේවය බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් නොව ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මඟින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මෙ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### දුරකථන ක්‍රියාකරු තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව ගැහැණු, පිරිමි දෙපක්ෂයෙන්ම අයදුම් පත්‍ර කැඳවයි. තෝරා ගනු ලැබූ අයදුම්කරු පළමුවරට බදුල්ල නාගරික සභාවට පත් කරනු ලැබේ.

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය : රු. 750—42×13—රු. 1,296.

3. අවශ්‍ය සුදුසුකම්.—(අ) වයස : 1966.7.26 දිනට වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුයි ;

(ආ) අයදුම්කරුවෝ පහත සඳහන් විභාගවලින් සමත්වී සිටිය යුත්තාහ :—

(i) (ඒ) ඉංග්‍රීසි, (බී) සිංහල/දෙමළ සහ (සී) අංක ගණිතය/ගණිතය යන විෂයයන් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය ; හෝ

(ii) (ඒ) ඉංග්‍රීසි, (බී) සිංහල/දෙමළ සහ (සී) අංක ගණිතය /ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි අවස්ථා ගණනකදී සමත් පොදු අධ්‍යයන (සාමාන්‍ය) සහතික පත්‍රය ;

(iii) අයදුම්කරුවන්ට දුරකථන ක්‍රියාකරුවෙකු ලෙස අවුරුද් දකට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුයි. අධ්‍යාපන සහතික සහ දුරකථන ක්‍රියාකරුවෙකු ලෙස පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද (මුල් ලිපි නොවේ) ඉදිරිපත් කළ යුතුයි. අයදුම් පතේ 8 වෙනි කොටු වෙහි (අධ්‍යාපන සුදුසුකම්) සම්මාන සාමාර්ථ්‍යය ලබා ඇති විෂයයන් සඳහන් කළ යුතුයි ;

(iv) දෙමළ කථා කිරීමේ දැනුම වාසියක් වේ.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධ යෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට, 1966.7.26 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නාමට නොවේ.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සුදුසු අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 ජූනි මස 21 දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

7–300—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### ජලකර්මාන්ත පරීක්ෂක තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරාගන්නා ලද අයදුම්කරුවෝ පළමුවරට මහනුවර නගර සභාවේ ජලකර්මාන්ත දෙපාර්තමේන්තුවට පත් කරනු ලබන්නාහ.

2. වැටුප් ක්‍රමය—වර්ෂයකට රු. 1,860—120 × 17—180 × 8—රු. 5,340—වර්ෂයකට රු. 3,420 සහ රු. 4,800 යන වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. කොළඹ නගර සභාවේ ඉංජිනේරු ඕවර්සියර්වරුන්ගෙන් සහ වෙනත් ප්‍රාදේශීය බල මණ්ඩලවල ජලකර්මාන්ත පරීක්ෂකවරුන්ගෙන්ද පමණක් අයදුම්පත් භාරගනු ලැබේ. අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(i) සත් අවුරුද්දක ප්‍රායෝගික පළපුරුද්ද, යටත් පිරිසෙයින් එයින් අවුරුදු දෙකක් ජලකර්මාන්ත පිළිබඳව විය යුතුය ; නැතහොත්,

(ii) ජලකර්මාන්ත පිළිබඳ යටත් පිරිසෙයින් අවුරුදු පහක පළපුරුද්ද.

අයදුම්කරුවන්ට පහත සඳහන් කාර්මික සුදුසුකම්වලින්ද එකක් වත් තිබිය යුතුය :—

(අ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරි සහතිකය (සිවිල්) ;

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ නාගරික ඉංජිනේරු ශිල්පය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල පාඨමාලාව) පිළිබඳ අවසාන සහතිකය ;

(ඇ) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි නිර්මාණය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල පාඨමාලාව) පිළිබඳ අවසාන සහතිකය, නැතහොත් වෙනත් සමාන සුදුසුකමක්.

4. තෝරා ගන්නා ලද අයදුම්කරුවන්ට, තමා පත්කරනු ලබන නගර සභා සීමාව ඇතුළත පදිංචිවන ලෙස නියම කරනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘතිපත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1966.7.26 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණී.

8. යෝග්‍යතා ඇති ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

1966 ජූනි මස 26 දින,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 530, කොළඹ.

7–660—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### වර්ක්ෂොප් තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරු පළමුවරට පානදුර පළාත් ආණ්ඩු සභාවට පත්කරනු ලැබේ.

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය : රු. 666—42 × 16—රු. 1,338.

3. අවශ්‍ය සුදුසුකම් :

(අ) වයස.—1966.7.26 දිනට වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුයි. උප්පැන්න සහතිකයේ පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතුය ;

(ආ) අයදුම්කරුවෝ යටත් පිරිසෙයින් සිංහල හෝ දෙමළ පස්වැනි පන්තියෙන් සමත් වී සිටිය යුත්තාහ ;

(ඇ) විශාල විෂ්කම්භයක් සහිත නල දැමීමේ දෑවුරුද්දක පළපුරුද්දක් අයදුම්කරුවන්ට තිබිය යුතු අතර, ප්‍රධාන ජලනල වැල්ව සහ අනිකුත් මූට්ටු කිරීම අළුත්වැඩියා කිරීමට හැකි විය යුතුය. සේවා සම්බන්ධ කිරීම් සඳහා ප්‍රධාන නලවලින් ජලය ඇද ගැනීම හා ජල කර්මාන්ත කටයුතුවලදී මුහුණ පෑමට සිදුවන සී. අයි. සහ වී. අයි. මූට්ටු කිරීම පිළිබඳ මනා දැනුමක්ද ඔවුනට තිබිය යුතුය.

ඉහත සඳහන් සුදුසුකම් හා පළපුරුද්ද සහිත අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතුය. අධ්‍යාපනික හා කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් පමණක් (මුල් පිටපත් නොවේ) අයදුම් පතට ඇමිණිය යුතුය.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1966.7.26 වැනි දිනට හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව, මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාර ගනු ලබන්නේ, ඒවා සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණ බවට සහතික කර, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණී.

8. සුදුසු අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති වෙනුවට.

1966 ජූනි මස 27 දින,
තැ. පෙ. 530, කොළඹ.

7–664—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### II වැනි ශ්‍රේණියේ සුසාන භූමි පාලක තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත් කැඳවයි.

2. තනතුරට නියමිත වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 960—17 × 42—2,184.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) 1966. 7. 26 දිනට අයදුම්කරුවන් වයස අවුරුදු 21 ට නොඅඩු සහ 25 ට නොවැඩි විය යුතුය.

(ආ) අයදුම්කරුවෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ යටත්පිරිසෙයින් සිංහල හෝ දෙමළ සහ උද්භිද විද්‍යාව යන විෂයයනට සම්මාන සාමාර්ථ දෙකක්ද ඇතුළුව සම්මාන සාමාර්ථයන් තුනක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් ලබාගත් අධ්‍යයන පොදු සහතික විභාගයෙන් හෝ මෙම විෂයයන් ඇතිව මේ හා සමාන හෝ වඩා උසස් විභාගයකින් හෝ සාමාර්ථය ලබා සිටිය යුත්තාහ.

(ඇ) වතුවැඩ පිළිබඳ සෑහෙන පළපුරුද්දක් හා දැනුමක් මෙන්ම කම්කරු පාලනය පිළිබඳ දැනුමක් හා පළපුරුද්දක් ද අවශ්‍යය.

4. තනතුර ස්ථිරයි. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරු පළමුකොටම කොළඹ නගර සභාවේ නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පත්කරනු ලැබේ. කොළඹ නගර සභා සීමාව තුළ වාසය කිරීමට ඔහුට නියම කරනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට 1966. 7. 26 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

සඳහන් ආකෘති පත්‍රයේ 13 වැනි ඡේදය වෙනුවට මේ කරුණු යොදා ගත යුතුය :—

"13. වතුවැඩ පිළිබඳ සහ කම්කරු පාලනය පිළිබඳ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර.——."

(ඉහත සඳහන් කරුණු සනාථ කිරීමට සහතික පත්‍රවල පිටපත් අයදුම් පතට ඇමිණිය යුතුය.)

7. පහත සඳහන් සහතික වල පිටපත් (මුල් සහතික නොව) අයදුම් කරුවන් විසින් අයදුම් පත්වලට ඇමිණිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය. (බෞතීස්ම සහතික හෝ ආධාර ලබන පාඨශාලාවල රෙගුලාසි පද්ධතිය වෙනුවෙන්. නිකුත් කරන ලද සහතික හෝ භාරගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) වතුවැඩ සහ කම්කරු පාලනය පිළිබඳ පළපුරුද්ද සනාථ කිරීම පිණිස සහතික.

8. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නාමට නොවේ.

නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා දෙපාර්තමේන්තු ප්‍රධානයා, පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට ප්‍රථම ලැබී ඇති බැව් සහතික කර, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

10. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ අයදුම් පත් පමණක් ලැබුණු බැව් දන්වනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 ජූනි මස 23 දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

7–681—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රුපියල් 1,140—23×120 සහ 8×180—රු. 5,340 ක් වේ. එහි රු. 2,220 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණයක් ද, රු. 4,800 ක වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිමක් ද ඇත.

3. අවශ්‍ය සුදුසුකම්.—

(අ) වයස—1966 ජූලි මස 26 වැනි දිනට වයස අවුරුදු 25 ට නො අඩු 40 ට නො වැඩි විය යුතුයි. උප්පැන්න සහතිකයේ පිට පතක් එවිය යුතුයි.

(ආ) අයදුම්කරුවන් යෝග්‍ය පරිදි සුදුසුකම් ලත් සෞඛ්‍ය පරීක්ෂක යින් බව සනාථ කිරීම සඳහා රාජකීය සෞඛ්‍ය සංගමයේ සහතිකය හෝ රාජකීය සෞඛ්‍ය ආයතනයේ සහතිකය හෝ ඔවුන් වෙත තිබිය යුතුයි. සහතිකයේ පිටපතක් එවිය යුතුයි.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට, 1966 ජූලි මස 26 වැනි දිනට හෝ ඊට පෙර පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි 13 වැනි අංකය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුයි :—

(අ) සනීපාරක්ෂක කටයුතු පිළිබඳ සුදුසුකම් පිළිබඳ විස්තර හා ඒ සුදුසුකම් ලබාගත් දින :————.

(ආ) දැනට කරන රක්ෂාව පිළිබඳ විස්තර—

(i) දැනට දරන තනතුරේ පදවි නාමය හා ශ්‍රේණිය, ඊට පත් වුණු දිනය :————.

(ii) දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවය කර ඇත්නම්, ඒ පිළිබඳ සේවා සටහන :————.

6. අයදුම් පතක් තැපෑලේදී නැතිවූ බවට, ප්‍රමාද වූ බවට කෙරෙන කිසිම චෝදනාවක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය එනතුරු අයදුම් පත් එවීම ප්‍රමාද කරන අපේක්ෂකයෝ තුමූම එවැනි අවදානම කට මුහුණ දෙති.

7. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නාමට නොවේ.

8. අවශ්‍ය සහතික පත්‍රවල පිටපත් අමුණා නො එවනු ලබන අයදුම් පත් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත.

9. නියමිත දිනට පසුව, රජයේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයක සේවය කරන නිලධාරීන්ගෙන් මේ කාර්යාලයට ලැබෙන අයදුම් පත්‍ර අවසාන දිනට පළමු ඒ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයේ නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිතුමා වෙත හෝ ලැබී ඇති බවට සහතික කර, ප්‍රමාදයට හේතු දක්වමින්, ඒ අයදුම් පත්‍ර භාර ගන්නා ලෙස ඔවුන් විසින් නිර්දේශ කරනු ලැබුවහොත් මිස, සලකා බලනු නොලැබේ.

10. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට පසු සති 3ක් ඇතුළත සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට පමණක් ඉල්ලුම් පත්‍ර ලැබුනු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

1966 ජූනි මස 29 දින,
තැ. පෙ. 530,
කොළඹ.

7–687—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### පළාත් පාලන සේවය

### පළාත් පාලන ලිපිකරු සේවයේ සාමාන්‍ය ලිපිකරු පංතියෙන් විධායක ලිපිකරු පංතියට (II වැනි ශ්‍රේණිය) උසස් කිරීමේ විභාගය—1966

පළාත් පාලන ලිපිකරු සේවයේ II වැනි ශ්‍රේණියේ විධායක ලිපිකරු පංතියට උසස් කිරීමේ විභාගය 1966 සැප්තැම්බර් මාසයේදී කොළඹ, මහනුවර, ගාල්ල සහ යාපනය යන මධ්‍යස්ථානයන්හි දී පවත්වනු ලැබේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දනුම්දෙනු ලැබේ.

විභාගය පවත්වනු ලබන්නේ විභාග කොමසාරිස් විසිනි.

(ii) සැම අයදුම්කරුවෙකු විසින්ම, තමා තෝරාගන්නා ලද පළමු වැනි හා දෙවැනි විභාග මධ්‍යස්ථානයන් අයදුම්පතේ 2 වැනි කොටුවේ සඳහන් කළ යුතුයි. සෑහෙන අපේක්ෂක සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන යම්කිසි මධ්‍යස්ථානයක් වේනොත්, එම මධ්‍යස්ථානය අවලංගු කරනු ලැබේ.

(iii) මොනම හේතුවක් නිසාවත්, විභාග මධ්‍යස්ථානයක් මාරුකිරීමට ඉඩදෙනු නොලැබේ.

2. වැටුප් සහ සේවාව පිළිබඳ කොන්දේසි.—(ඒ) සමත්වන අයදුම් කරුවන් රුපියල් 1,620 න් පටන්ගෙන, රුපියල් 120 බැගින් රුපියල් 3,780 දක්වා වැඩිවන වාර්ෂික වැටුප් ක්‍රමයක් හිමි, පළාත් පාලන ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ (දෙවැනි ශ්‍රේණියේ) තනතුරුවලට පුරප්පාඩු ඇතිවන අන්දමට පත්කරනු ලැබේ මෙම වැටුප් ක්‍රමයේ වර්ෂයකට රුපියල් 3,180 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිත වේ. රජයේ ප්‍රමාණයන්ට හා නියමයන්ට අනුව ගෙවල් කුලී දීමනාද, තාවකාලික ජීවන වියදම් දීමනා හා විශේෂ ජීවන වියදම් දීමනාද ගෙවනු ලැබේ.

(බී) සමත්වන සැම අයදුම්කරුවෙක්ම, පළාත් පාලන සේවා රෙගුලාසිවල අංක 22(2) දරණ රෙගුලාසිය අනුව, පළාත් පාලන ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියට (II වැනි ශ්‍රේණිය) වැඩ බැලීමේ පදනමක් මත පත්කරනු ලැබේ. ඔවුන් සිය තනතුරුවල ස්ථිර කිරීම, වැඩ බැලීමේ කාල සීමාව අවසානයේදී සලකා බලනු ලැබේ. වැඩ බැලීමේ කාල සීමාව ප්‍රථම අවස්ථාවේදී හය මසකට සීමාවේ. ඔව්හු පළාත් පාලන සේවා ආඥපනතට (264 පරිච්ඡේදය) සහ ඒ පිළිබඳව තවදුරටත් කෙරෙන සංශෝධනවලට හා එම ආඥපනත යටතේ සම්පාදිත වෙනත් රෙගුලාසි

(ii) සිංහල/දෙමළ භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයේ iv වැනි ශ්‍රේණියේ පරීක්ෂණයෙන් හෝ v වැනි ශ්‍රේණියේ පරීක්ෂණයෙන් හෝ සමත් වී ඇති අපේක්ෂකයෝ.

(iii) සිංහල/දෙමළ භාෂාමය ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත් වී ඇති අපේක්ෂකයෝ.

(iv) සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව හෝ විෂයයක් වශයෙන් ඇතිව ඉංග්‍රීසි භාෂාමය ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත් වී ඇති අපේක්ෂකයෝ.

(v) සිංහල/දෙමළ භාෂාමය ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය සමත් වී ඇති අපේක්ෂකයෝ.

11. විභාගය පිළිබඳ කාල සටහන පහත සඳහන් පරිදිය :—

පෙරවරු 9.00 සිට පෙරවරු 10.30 දක්වා—පළාත් පාලන ගිණුම්
පෙරවරු 10.45 සිට පස්වරු 12.15 දක්වා—සිංහල/දෙමළ
පස්වරු 1.15 සිට පස්වරු 3.15 දක්වා—පළාත් පාලන ආඥාපනත් යනාදිය

සිංහල/දෙමළ පිළිබඳ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයත්, වේලාවත් ස්ථානයත් ඊට සුදුස්සන් වන සැම අපේක්ෂකයකු වෙතම විභාග කොමසාරිස් විසින් වෙනම දන්වා යවනවා ඇත.

12. සමත්වන අයදුම්කරුවන්ගේ නම්, ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ iv වැනි කොටසේ පළකරනු ලැබේ. පුරප්පාඩු ඇතිවන අන්දමට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 ජූනි මස 26 වැනි දින,
තැ.පෙ. 530, කොළඹ.

විභාග අංකය : ....................
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

## පළාත් පාලන සේවය

### පළාත් පාලන ලිපිකරු සේවයේ සාමාන්‍ය ලිපිකරු පංතියේ සිට විධායක ලිපිකරු පංතියට (දෙවැනි ශ්‍රේණියට) උසස් කිරීමේ විභාගය—1966

(1966 ජූලි මස අට වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ හතර වැනි කොටස බලන්න.)

#### විභාගයට ඇතුල්වීම සඳහා ඉල්ලුම් පත්‍රය

සැ.යු.—මෙම ආකෘති පත්‍රය අපේක්ෂකයාගේ අත් අකුරින් නිවැරදිවද, පැහැදිලිවද පුරවා, 1966 ජූලි මස 27 වැනි දිනට හෝ ඊට පෙර හෝ " පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති, තැ. පෙ. 530, කොළඹ " යන ලිපිනයට ලැබෙන සේ, අපේක්ෂකයා දැනට සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානතුමා මගින් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය

1. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
2. විභාගයට පෙනී සිටීමට කැමති මධ්‍යස්ථාන දෙකක්—කැමැත්තේ පිළිවෙලට :————.
   (කොළඹ, මහනුවර, ගාල්ල, යාපනය)
3. සම්පූර්ණ ලිපිනය (ලිපිනයේ වෙනසක් වූ විට, ඒ බව වහාම දැන්විය යුතුයි) ————.
4. අපේක්ෂකයා දැනට සේවය කරන ප්‍රාදේශීය බලමංඩලය :————.
   (කොළඹ නාගරික සභාවේ නම්, දෙපාර්තමේන්තුවද සඳහන් කරන්න)
5. **1966** අගෝස්තු **31** වැනි දිනට ලිපිකරුවෙක් වශයෙන් සේවා කාලය :
   අවුරුදු :————.
6. පළාත් පාලන ලිපිකරු සේවයේ සාමාන්‍ය ලිපිකරු පංතියට පත්වීම ලද දින :————.
7. පළාත් පාලන සේවයේ සහකාර ලිපිකරුවෙක් වශයෙන් පත්වීම ලද දිනය :————.
8. ගම්සභා ලිපිකරු සේවයේ ලිපිකරුවෙක් වශයෙන් පත්වීම ලද දිනය :————.
9. ගැසට් නිවේදනයේ 10 වැනි ඡේදයේ සඳහන් අංක (3) දරණ සිංහල/දෙමළ විෂයයෙන් නිදහස් කරනු ලැබීමට සුදුසුකම් ඇත්නම්, ඒ පිළිබඳ විස්තර ;—
   (ඒ) සමත් වී ඇති විභාගය :————.
   (බී) විභාගය පැවත් වූ දිනය :————.
   (සී) විභාග අංකය :————.
10. විභාගයට පෙනී සිටින්නේ පහත සඳහන් කුමණ මාධ්‍යයෙන් ද යන වග සඳහන් කරන්න :—
    (ඒ) සිංහල :————.
    (බී) ඉංග්‍රීසි :————.
11. පහත සඳහන් විෂයයන් දෙකෙන් ඔබ පෙනී සිටීමට අදහස් කරන්නේ කුමණ විෂයයටදැයි සඳහන් කරන්න :—
    (ඒ) සිංහල :————.
    (බී) දෙමළ :————.

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

සභාපති,
ප.පා.සේ. කොමිෂන් සභාව,
කොළඹ.

මෙම ප්‍රාදේශීය බලමණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ නියුක්ත, ඉහත නම් සඳහන් නිළධාරියා පළාත් පාලන ලිපිකරු සේවයේ සාමාජිකයෙකු බව සහතික කරමි. ඔහුගේ සේවා විස්තර පහත සඳහන් පරිදි වේ:—

(1) ගම්සභා ලිපිකරු සේවයේ..............දින සිට...........දින දක්වා
(2) සහකාර ලිපිකරු සේවයේ..............දින සිට...........දින දක්වා
(3) සාමාන්‍ය ලිපිකරු සේවයේ..............දින සිට...........දින දක්වා

ඔහුගේ සේවය සැමවිටම සතුටුදයක වූ බවත් සහතික කරමි. ඔහු විසින් මෙම ආකෘති පත්‍රයේ දක්වා ඇති විස්තර නිවැරදි වේ.

————,
නා:කො./සභාපතිතුමාගේ අත්සන.

ප්‍රාදේශීය බලමංඩලයේ නාමය :————.
නා.ස./ප.ආ.ස./සු.න.ස./ග.ස.

දිනය : 1966 ————.

7–744—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### පහළ ශ්‍රේණියේ ලඝුලේඛකයින්ගේ සේවයට බඳවා ගැනීමේ (ඉංග්‍රීසි) විභාගය—1966.2.26

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව පහත සඳහන් අපේක්ෂකයා පහළ ශ්‍රේණියේ ලඝුලේඛකයින්ගේ සේවයට (ඉංග්‍රීසි) (" සී " ප්‍රදේශය) පත් කිරීම සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් තෝරා ගන්නා ලද බව මෙයින් දන්වනු ලැබේ :—

වේලුපිල්ලේ එන්. ... අර්තියාඩි, පේදුරුතුඩුව.

මෙම අපේක්ෂකයාට වහාම පත්වීමක් ලබා දීමට කොමිෂන් සභාව භාරගනු නොලැබේ. පුරප්පාඩු ඇති වූ විට පත්වීමක් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඒ විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1966 ජූනි මස 24 දින,
තැ. පෙ. 530,
කොළඹ.

7–745—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### I, II, III ශ්‍රේණිවල ජලකර්මාන්ත අධිකාරීන්ගේ, I, II, III ශ්‍රේණිවල කර්මාන්ත අධිකාරීන්ගේ, කොළඹ නාගරික සභාවේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරුන්ගේ, කොළඹ නාගරික සභාවේ ජලකර්මාන්ත හා ජලපවාහන දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරුන්ගේ හා අනෙකුත් ප්‍රාදේශීය බලමණ්ඩලවල ජලකර්මාන්ත පරීක්ෂකවරුන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය

ඉහත සඳහන් විභාගය පිළිබඳව 1966 අප්‍රියෙල් මස 29 වෙනි දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළවූ දැන්වීමට වැඩිදුරටත්ය. පහත නම් සඳහන් අපේක්ෂකයාද ඔහුගේ නාමට ඉදිරියෙන් දී ඇති විෂයයට පෙනී සිටීමෙන් නිදහස් කරන ලදී. ඔහු III වැනි ශ්‍රේණියේ කර්මාන්ත අධිකාරීන් සඳහා නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කර ඇත :—

ඊස්වරම් එම්. ... ත්‍රිකෝණමිතිය

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

තැ. පෙ. 530, කොළඹ.
1966 ජූනි මස 23 දින.

7–746—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### වෘත්තීය සුදුසුකම් නොලත් කර්මාන්ත ඉංජිනේරුවරුන්ගේ ශ්‍රෙණියට (සිවිල්) උසස් කිරීමේ විභාගය—1965 ජූනි

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල පහත සඳහන් වේ :—

| | අපේක්ෂකයාගේ නම | ප්‍රාදේශීය බල මණ්ඩලය | සමත් කළ විෂයයන් |
|---|---|---|---|
| 1. | පීරිස්, එම්. එච්. | කුරුණෑගල නා. ස. | මැනුම් හා මට්ටම් ගැනීම II ප්‍රායෝගික |
| 2. | පෙරේරා, ඊ. ඊ. සී. | කොළඹ නා. ස. | වාස්තු විද්‍යාත්මක ඇඳීම |

1966 ජූනි මස 23 දින,
තැ. පෙ. 530, කොළඹ.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

7–747/1—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### කණිෂ්ඨ කාර්මික නිලධාරීන් සඳහා පවත්වනු ලබන දෙපාර්තමේන්තු පරීක්ෂණය

### උප පරීක්ෂක ශ්‍රෙණිය—1965 ජූනි

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල පහත සඳහන් වේ:—

| | අපේක්ෂකයාගේ නම | ප්‍රාදේශීය බල මණ්ඩලය | සමත් කළ විෂයයන් |
|---|---|---|---|
| 1. | ඒකනායක, ඊ. එම්. කේ. | ඇටම්පිටිය ග. ස. | (i) ප්‍රමාණ ගැනීම (පහළ පත්‍රය) |
| 2. | පියරත්න, එච්. පී. | පස්සර සු. න. ස. | (i) අංක ගණිතය හා වීජ ගණිතය<br>(ii) ප්‍රමාණ ගැනීම (පහළ පත්‍රය)<br>(iii) සැලසුම් ඇඳීම හා පිටපත් කිරීම |
| 3. | සංසදය, ඩී. ඩබ්ලිව්. | බෝගොඩ දකුණ ග. ස. | (i) අංක ගණිතය හා වීජ ගණිතය<br>(ii) ප්‍රමාණ ගැනීම (පහළ පත්‍රය)<br>(iii) මැනුම් හා මට්ටම් ගැනීම (පහළ පත්‍රය)<br>(iv) සැලසුම් ඇඳීම හා පිටපත් කිරීම |

1966 ජූනි මස 23 දින,
තැ. පෙ. 530, කොළඹ.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

7–747/2—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ඩී.—බී. 46/54. ඇල්. ජී. ඩී.—ජී. අයි. 9/6.

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උඩසිය පත්තු ගම්ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව, එකී වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1966 මැයි මස 29 වැනි දින,
කොළඹ දී ය.

අතුරු ව්‍යවස්ථාව

### කැළි කසළ ඉවත් කිරීම පිළිබඳ ගාස්තු

1. (1) සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල VI වැනි කොටසේ 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා සභාවට ගෙවිය යුතු කැළි කසළ ඉවත් කිරීමේ ගාස්තුව මාසයකට රුපියල් එක බැගින් විය යුතු ය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවෙහි "සභාව" යනුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උඩසිය පත්තු ගම්ප්‍රදේශයේ ගම් සභාව අදහස් වේ.

7–675—66.7.8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 36/52.
ප. පා. දෙ.—ජී. 6/2.

### ප්‍රාදේශීය බලමණ්ඩල (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1. (261 වෙනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතෙහි 4 වෙනි වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් සම්පාදිතව මෙහි පහත දක්වා ඇති අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් එම පනතේ 2 වෙනි වගන්තිය අනුව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

2. එකී අතුරු ව්‍යවස්ථා කෙටුම්පතෙහි අඩංගු විධිවිධාන ඇතුළත් අතුරු ව්‍යවස්ථාවක් පැනවීමට (257 වෙනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතෙහි 42 වෙනි වගන්තියෙන් ගම්සභාවලට බලය පවරනු ලබන අතර, එකී අතුරු ව්‍යවස්ථාවල අඩංගු විධිවිධාන පිළිගැනීමට ඉහත කී 2 වෙනි වගන්තියෙහි (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත් ව, ගම්සභාවලට බලය දෙනු ලැබේ.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 ජූනි මස 18 දින,
කොළඹ දී ය.

අතුරු ව්‍යවස්ථා

### XXXIX වෙනි කොටස

#### වාහන හා සතුන් පිළිබඳ බද්දට අදාළ වන අතුරු ව්‍යවස්ථා

1. (1) ආඥාපනතේ 39 වෙනි වගන්තිය යටතේ වාහන හා සතුන් පිළිබඳ බද්දේ කාර්යයන් සඳහා ඒ බද්දට යටත් වන යම් වාහනයක් හෝ සතකු ස්වකීය ස්වාමිත්වයෙහි, භාරයෙහි හෝ පාලනය යටතේ ඇති සෑම තැනැත්තකු ම සභාවේ කාර්යාලයෙන් ලබා ගත හැකි, මේ සඳහා සභාව මගින් සපයා ඇති ආකෘති පත්‍රයෙහි විස්තර අඩංගු උප ලේඛනයක් සභාපති වෙත සැපයිය යුතු ය.

(2) (1) වෙනි ඡේදයෙහි සඳහන් උපලේඛනය ආඥාපනතේ 39 වෙනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින තැනැත්තා විසින් සම්පූර්ණ කරනු ලැබ, මෙම අතුරු ව්‍යවස්ථා සභාව විසින් පිළිගනු ලබන දින සිට දවස් 30 ක් ඇතුළත සභාපති වෙත යැවිය යුතු ය. තවද ඒ වාහනය හෝ සතා ඒ තැනැත්තාගේ ස්වාමිත්වයෙහි, භාරයෙහි හෝ පාලනය යටතේ ඇති පසු ව එළඹෙන යම් වර්ෂයක් සම්බන්ධයෙන් එබඳු උපලේඛනයක් ඔහුගෙන් අවශ්‍ය නො විය යුතු ය.

2. 1 වෙනි අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් උපලේඛනය සපයා ඇති සෑම තැනැත්තකුම, ආඥාපනතේ 39 (2) වෙනි වගන්තියෙහි විධිවිධානවලට යටත් ව, තවත් දැනුම් දීමක් නොමැති ව—

(අ) ඒ උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් වාහන හා සතුන් පිළිබඳ ව තමා ඒ උපලේඛනය සපයා ඇති වර්ෂය සඳහා සභාපති විසින් ඒ සඳහා තමා වෙත දැනුම් දිය හැකි කාලය ඇතුළත බද්ද ගෙවීමට ; සහ

(ආ) ඒ උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් වාහන හෝ සතුන් අතුරෙන් පසු ව එළඹෙන සෑම වර්ෂයක ම දින 30 කට වැඩියෙන් ස්වකීය ස්වාමිත්වයෙහි, භාරයෙහි හෝ පාලනය යටතේ පවතින වාහන හෝ සතුන් සම්බන්ධයෙන් ඒ වර්ෂය සඳහා වූ බද්ද ඒ වර්ෂයේ මාර්තු මස තිස් එක් වෙනි දින හෝ ඊට පෙර ගෙවීමට ද,

යටත් විය යුතු ය.

3. 1 වෙනි අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් උපලේඛනය සපයා දුන් පසු ඒ උපලේඛනයෙහි සඳහන් නො වන්නා වූ ද ආඥාපනත අනුව බද්දට යටත් වූ ද යම් වාහනයක් හෝ සතකු යම් තැනැත්තෙක් අත්කර ගතහොත්, තබා ගතහොත් හෝ පාවිච්චි කළහොත්, නො එසේ ව, 1 වෙනි ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා ඇති යම් තැනැත්තෙක් ඒ බද්දට යටත් වන යම් වාහනයක් හෝ සතකු පළමු වරට අත්කර ගතහොත්, තබා ගතහොත් හෝ පාවිච්චි කළහොත්, ඔහු ඒ වාහනය හෝ සතා අත්කර ගන්නා හෝ තබා ගැනීම හෝ පාවිච්චි කිරීම ආරම්භ කරන දින සිට මාසයක් ඇතුළත එසේ අත්කර ගැනීම හෝ පාවිච්චි කිරීම පිළිබඳ සිද්ධිය සඳහන් කරමින් ඔහු විසින් සභාපති වෙත ලිඛිත දැන්වීමක් යැවිය යුතු අතර, සභාව විසින් ඒ සඳහා සපයා දෙනු ලැබිය හැකි ආකෘතිය අනු ව ලියවිල්ලකින් වූ විස්තර ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතු ය.

4. ආඥාපනතෙහි 39(2) වෙනි වගන්තියේ විධිවිධානවලට යටත් ව, 3 වෙනි අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් ලිඛිත ප්‍රකාශය සපයා දී ඇති සෑම තැනැත්තකු ම ස්වකීය ස්වාමිත්වයෙහි, භාරයෙහි හෝ පාලනය යටතේ ඇත්තා වූ ද ඒ ප්‍රකාශයෙහි නිශ්චිත ව සඳහන් වූ ද වර්ෂය සම්බන්ධයෙන් සහ ඉන් පසු ව එළඹෙන සෑම වර්ෂයක් සම්බන්ධයෙන් ද සභාපති විසින් ඒ සඳහා තමා වෙත නිවේදනය කළ හැකි කාලයක් ඇතුළත බදු ගෙවීමට යටත් විය යුතු ය.

5. 1 වෙනි අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් උපලේඛනය හෝ 3 වෙනි අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් ලිඛිත ප්‍රකාශය සපයා දීමෙන් පසු ඒ ප්‍රකාශයෙහි හෝ උපලේඛනයෙහි සඳහන් යම් වාහනයක් හෝ සතකු සම්බන්ධයෙන් බදු ගෙවීමට යටත් වීමෙන් තමා නිදහස් ය යි හිමිකම් කියන සෑම තැනැත්තකු ම ස්වකීය ඉල්ලීම ඉදිරිපත් කිරීමේ හේතු නිශ්චිත වශයෙන් දක්වා එසේ නිදහස් වීම සඳහා ස්වකීය ඉල්ලීම පිළිබඳ ව සභාපති වෙත ලියවිල්ලකින් වහාම දැනුම් දිය යුතු ය.

6. 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වෙනි අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් ලිඛිත ප්‍රකාශය සපයා දීමෙන් පසු යම් වාහනයක් හෝ සතකු අයිතිකර ගැනීම, තබා ගැනීම හෝ පාවිච්චි කිරීම අවසන් කරන සෑම තැනැත්තකු ම ඒ වාහනය හෝ සතා අයිතිකර ගැනීම, තබා ගැනීම හෝ පාවිච්චි කිරීම තමා අවසන් කර සිටින බව දන්වා සභාපති වෙත ලිඛිත දැන්වීමක් වහාම යැවිය යුතු ය.

7. යම් තැනැත්තකු විසින් බද්ද ගෙවනු ලබන විට, ඒ බද්ද ගෙවනු ලබන්නේ යම් වාහනයක් සම්බන්ධයෙන් ද ඒ සෑම වාහනයක් සම්බන්ධයෙන් වූ ලෝහ තහඩුවක්, සභාව විසින් ඒ සඳහා නිශ්චය කළ හැකි වාහන සඳහා වූ හැඳින්වීමේ අක්ෂර ද තහඩුව නිකුත් කරනු ලබන වර්ෂය දක්වෙන ඉලක්කම් ද වාහන ලේඛනයෙහි එයට දී ඇති අනුරූප අංකය ද සහිත ලෝහ තහඩුවක් සභාපති විසින් ඒ තැනැත්තා වෙත නිකුත් කළ යුතු ය.

8. 7 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලැබූ එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ අන් ලෙසකින් නො පැහැදිළි හෝ විරූපී වුවහොත්, අයිතිකරු විසින් එය සභාපති වෙත ආපසු දිය යුතු අතර ශත පනහක් ගෙවූ විට අලුත් තහඩුවක් ලැබීමට අයිතිකරුට හිමිකම් ලැබිය යුතු ය. එබඳු යම් තහඩුවක් නැති වී ඇතැ යි හෝ සොරකම් කර ඇතැයි දිවුරුම් පත්‍රයක මාර්ගයෙන් හෝ අන් ලෙසකින් සෑහීමට පත් වූ විට සභාපති විසින්, අයිතිකරුගේ ඉල්ලීම පරිදි හා ඔහු විසින් ශත හැටක මුදලක් ගෙවූ විට, ඔහුට අලුත් තහඩුවක් නිකුත් කළ හැකි ය.

9. සෑම වාහනයක ම අයිතිකරු විසින් හෝ එය භාරව සිටින තැනැත්තා විසින්, 7 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ වාහනය පිළිබඳ ව නිකුත් කරන ලද තහඩුව ඒ වාහනයෙහි ප්‍රකට ව පෙනෙන කොටසක සවි කළ යුතු ය.

10. යම් මාර්ගයක හෝ අතුරු පාරක ගමන් කරන යම් වාහනයක්, 9 වෙනි අතුරු ව්‍යවස්ථාව මගින් ඒ වාහනයෙහි සවි කොට තිබිය යුතු ලෝහ තහඩුව පරීක්ෂා කිරීමේ කාර්‍ය්‍යය සඳහා සභාපති විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් නැවැත්වීම සහ රඳවා තබා ගැනීම නීත්‍යානුකූල විය යුතු ය. තවද, සභාපති විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් තැනැත්තකු විසින් එලෙස ඉල්ලා සිටිනු ලැබූ කල ඒ වාහනයෙහි රියැදුරු හෝ එය භාරව සිටින තැනැත්තා විසින් වාහනය නතර කොට ඒ තහඩුව පරීක්ෂා කිරීමට ඉඩ දිය යුතු ය.

## XL වෙනි කොටස

### ආයුර්වේද බෙහෙත් ශාලාවලට අදාළ වන අතුරු ව්‍යවස්ථා

1. (257 වෙනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතෙහි 36 වෙනි වගන්තිය යටතේ ගම් සභාවක් විසින් පිහිටුවන ලද එක් එක් ආයුර්වේද බෙහෙත් ශාලාව ගම් සභාව විසින් නඩත්තු කරනු ලැබ, 1961 අංක 31 දරන ආයුර්වේද පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කර ඇතැයි සලකනු ලබන වෛද්‍යවරයකුගේ භාරයෙහි තිබිය යුතු ය.

2. 1 වෙනි ව්‍යවස්ථාවෙහි සඳහන් වෛද්‍යවරයා හෝ ගම් සභාව විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ අන් කිසි නිලධරයකු ස්වකීය භාරයෙහි වූ ආයුර්වේද බෙහෙත් ශාලාවට අදාළ වූ ද සභාව විසින් නිශ්චය කළ හැක් වූ ද ගිණුම් පොත් සහ වෙනත් ලේඛන සභාව විසින් අනුමත කළ හැකි ආකාරයෙන් තබා ගත යුතු ය.

